දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජුනි/ජූලි
Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

බෞසංසා 2.2 - බෞද්ධ සමාජ දර්ශනය
# BCG 2.2 - The Social Philosophy of Buddhism

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. බ්‍රාහ්මණ සමාජයේ චතුර්වර්ණය ප්‍රතික්ෂේප කොට සමාජ ඒකියත්වය තහවුරු කිරීමෙහි ලා උපයුක්ත බෞද්ධ ඉගැන්වීම් මොනවා දැයි පෙන්වා දෙන්න.

02. පෞරුෂත්වය පිළිබඳ ඉදිරිපත් කොට ඇති විද්වත් මත දක්වා පූර්ණ පෞරුෂත්වයකින් යුතු පුද්ගලයෙකු නිර්මාණය කිරීමට බෞද්ධ ඉගැන්වීම් තුළින් ලැබෙන අනුබලය ප්‍රකට කරන්න.

03. ප්‍රගතිය කරා සමාජය මෙහෙයවීමේ දී ගැඹුරු ප්‍රතිවේධයක් හා ආධ්‍යාත්මික ශික්ෂණයක් සහිත නායකත්වයක් නිර්මාණය කිරීමට බෞද්ධ දේශපාලන දර්ශනයෙන් ලැබෙන පිටිවහල අගයන්න.

04. සංඝ සමාජයේ සාමූහිකත්වය සුරැකීමට මෙන්ම ආධ්‍යාත්මික කළමනාකරණයෙහි ලා සාංඝික දේපල ක්‍රමයෙහි ඇති අදාළත්වය පෙන්වා දෙන්න.

05. අධිපරිභෝජනය හා අක්‍රමවත් මූල්‍ය ආයෝජනය රටක ආර්ථික පරිහානියෙහි ලා හේතුවන ආකාරය බෞද්ධ මූලාශ්‍ර ඇසුරින් ප්‍රකට කරන්න.

06. මත්ද්‍රව්‍ය භාවිතය සමාජ සදාචාර පරිහානියෙහි ලා හේතුවන ආකාරය පෙන්වා දී එය නවතාලීමට ලබා දිය හැකි බෞද්ධ විසඳුම් පිළිබඳ සාකච්ඡා කරන්න.

07. ප්‍රීතිමත් පවුල් ජීවිතයක් අරභයා උපයෝගී කොට ගත හැකි බෞද්ධ සදුපදේශයන් කවරේදැයි විමසන්න.

08. ලෝක පාරිසරික හා දේශගුණික අර්බුද නිරාකරණයෙහි ලා බෞද්ධ පාරිසරික දර්ශනයෙන් ලැබෙන පිටිවහල ප්‍රකට කරන්න.

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගිනි)